FACTSHEET

PUBLIC TRUSTEE AND GUARDIAN

# අන්තිම කැමති පත්‍ර

## අන්තිම කැමති පත්‍රයක් සාදන්නේ ඇයි?

අපගේ ජීවිතයෙන් බොහෝ කාලයක් ගතවන්නේ වත්කම් ගොඩනගා ගැනීමටය. ඔබ සහ ඔබගේ පවුලේ අය හට අවශ්‍ය ජීවන රටාව සහ ආරක්ෂාව නිවෙසක්, කාරයක්, බෝට්ටුවක්, සුපර්ඇනුවේෂන්, රක්ෂණ සහ වෙනත් ආයෝජන මගින් ලබාදේ. ජීවිත කාලයක් ඔබ විසින් කලදේ ඔබට අවශ්‍ය අයට ලබාදිය හැකි එකම මග වන්නේ අන්තිම කැමති පත්‍රයක්  සකස් කිරීම මගිනි.

ඔබට සමීප අයට සහ ඔබ වගකීමෙන් බැඳී සිටින අයට ආරක්ෂාව ඒ මගින් ලබාදෙන අතර ඔබගේ මරණින් පසු අනවශ්‍ය අපහසුතා ඇතිවීමද වළක්වයි.

ඔබගේ බාලවයස් (වයස අවුරුදු 18ට අඩු) දරුවන් සම්බන්ධයෙන් භාරකරුවන් නම්කල හැකි අතර ඔවුන්ගේ නඩත්තුව සහ අධ්‍යාපනය සම්බන්ධයෙන් කටයුතු පිළියෙල කල හැකිය.

## ඔබගේ පොල්මක්කරුවා විය යුත්තේ කවුරුන්ද?

ඔබගේ පොල්මක්කරු ඔවුන්ගේ නීත්‍යානුකූල වගකීම් දැනගත යුතු අතර ඔබගේ කටයුතු කළමණාකරණය සම්බන්ධයෙන් අවශ්‍ය කාලය මිඩංගු කිරීමට හැකි විය යුතුය. පොල්මක්කාරයෙකු වශයෙන් කටයුතු කිරීම වගකිවයුතු කාර්යයක් වන අතර නීතිය, ගණකාධිකරණය සහ බදු සම්බන්ධ අවබෝධයක් තිබිය යුතුය. පොල්මක්කාරයෙකුගේ රාජකාරි අතරට පහත දේ ඇතඃ

- අන්තිම කැමති පත්‍රය සොය ගැනීම;
- වත්කම් නිර්ණය කර ආරක්ෂා කිරීම;
- අධිකරණයේ අන්තිම කැමති පත්‍රය ඔප්පු කිරීම;
- භාර ඇති කිරීම;
- ආදායම් බදු ගොනු කිරීම් සහ ප්‍රාග්ධන එකතු කිරීමේ බදු කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීම; සහ
- අන්තිම කැමති පත්‍රයේ කොන්දේසිවලට අනුව වත්කම් බෙදා හැරීම සහ පැවරීම.

## අපගේ ගාස්තු

ඔබගේ අන්තිම කැමති පත්‍රය සකසන අවස්ථාවේ සාමාන්‍යයෙන් අවම ගාස්තුවක් ඇත.

වත්කම් බෙදාහරින අවස්ථාවේදී ඔබගේ බූදලයේ මුළු වටිනාකමින් කුඩා ප්‍රතිශතයක් අයකෙරේ. අපගේ ගාස්තු සහ කොමිස් ACT නීතිපතිවරයා විසින් තීරණය කර ඇති අතර WPI වලට අනුකූලව වාර්ෂිකව ගලපන අතර වසර 3ක විමර්ශණයකටද යටත්වේ. හවුල් හිමිකම් වත්කම් සම්බන්ධයෙන් කොමිස් අය නොකෙරේ.

ලබාදෙන සේවා සම්බන්ධ හොඳ දැනුමක් ඇතිව මිල ගණන් සන්සන්දනය කල යුතුවීම හේතුවෙන් ඔබ අපගේ සේවාව හෝ වෙනත් භාරකාර සේවාවක් යොදා ගැනීමට පෙර, අපගේ ගාස්තු සම්බන්ධයෙන් සාකච්ඡාකර ගන්නා ලෙස අපි ඔබව උනන්දු කරමු.

## මාගේ අන්තිම කැමති පත්‍රය තැබිය යුත්තේ කොහිද?

ඔබගේ අන්තිම කැමති පත්‍රය වටිනා ලියවිල්ලක් වීම හේතුවෙන් ආරක්ෂාකාරී තැනක තැබිය යුතුවේ. මහා භාරකරු සහ භාරකරු විසින් පිළියෙල කරන ලද අන්තිම කැමති පත්‍ර ගාස්තු අය කිරීමක් නොමැතිව ආරක්ෂාකාරීව තබයි. ඔබගේ අන්තිම කැමති පත්‍රයේ පිටපතක් ඔබටද ලබාදේ.



Ground Floor
221 London Circuit
Canberra City ACT 2601

PO Box 221
Civic Square ACT 2608

Tel (02) 6207 9800
Fax (02) 6207 9811

Email ptg@act.gov.au
Web www.ptg.act.gov.au

## මාගේ අන්තිම කැමති පත්‍රයට වෙනස්කම් කල යුත්තේ කුමන අවස්ථාවේද?

ඔබගේ පුද්ගලික අවස්ථානුගත කරුණු වෙනස් වන්නේ නම්, ඔබගේ අන්තිම කැමති පත්‍රයට වෙනස්කම් සිදුකල හැකිය. උදාහරණ වශයෙන් විවාහවීම හෝ දික්කසාදවීම, දරුවන් ලැබීම, ගමන් යාම හෝ නව වත්කම් එකතුවීම ආදිය මගින් ඔබගේ අන්තිම කැමති පත්‍රය නැවත සලකා බැලීම අවශ්‍යයවේ. ඔබ විවාහවූවිට දෙදෙනා සම්බන්ධයෙන්ම පවතින අන්තිම කැමති පත්‍ර ඉබේම අවලංගුවේ.

ඔබගේ අන්තිම කැමති පත්‍රය සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් මහා භාරකාරයාගේ කාර්ය මණ්ඩලය හට හොඳ පලපුරුද්දක් ඇත.

## ඔබගේ අන්තිම කැමති පත්‍රය මගින් පුණ්‍ය ආයතනවලට ලබාදීම

GreaterGood ලෙසින් හැඳින්වෙන Capital Region Community Foundation සම්බන්ධයෙන් භාරකරු වශයෙන් කටයුතු කරන්නේ මහා භාරකාරවරයාය. සිය අන්තිම කැමති පත්‍රය මගින් පුණ්‍ය අරමුණු සඳහා උපකාර කිරීමට බලාපොරොත්තුවන අය සඳහා මෙම පදනම නිර්දේශ කෙරේ.

GreaterGood යනු මහා භාරකාරවරයා විසින් ස්ථාපනය කරන ලද මහජන පුණ්‍ය පදනමකි. GreaterGood සතුව බදු අරමුණු වෙනුවෙන් බදුවලින් නිදහස් කල පුණ්‍ය ආයතනයක් ලෙස ඕස්ට්‍රේලියානු බදු කාර්යාල කටයුතු සම්බන්ධයෙන් සැලකේ. GreaterGood එයට අදාල ත්‍යාග අරමුදල බදුවලින් අඩුකරගත හැකි ත්‍යාග තත්වය දරයි.

මෙම පදනම පුණ්‍ය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ස්ථිර සහ වර්ධනය වන අරමුදල් සපයන මූලාශ්‍රයකි. වැඩිදුර තොරතුරු සොයා ගැනීම සඳහා කරුණාකර මහා භාරකාරවරයා හා සම්බන්ධ වන්න.

## අන්තිම කැමති පත්‍රයක් තිබීම වැදගත් වන්නේ ඇයි?

අන්තිම කැමති පත්‍රයක් සකස් කිරීම විශේෂඥ දැනීම අවශ්‍ය කටයුත්තකි. මෙයට සංකීර්ණ මූල්‍ය, නෛතික සහ බදු බලපෑම් ඇති අතර ඔබට අවශ්‍ය ආකාරයට ඔබගේ මුදලය බෙදා හරින බව සහතික කිරීම සඳහා මෙම සියල්ල සැලකිල්ලට ගත යුතුය.

## ඔබගේ මුදලය කල්තියා බෙදා හැරීම

වෘත්තීය වශයෙන් සකසන ලද අන්තිම කැමති පත්‍රයක් මගින් ඔබගේ මුදල පරිපාලනය කිරීමට සහ ඔබගේ වත්කම් බෙදා හැරීමට ගතවන කාලය සහ වියදම අඩුකර ගැනීමට බෙහෙවින් උපකාර වන අතර දුර්වල ලෙස ලියන ලද දේ අර්ථකථනය කිරීමට ගතවන කාලය බෙහෙවින් අඩුකර ගත හැකිය.

## ප්‍රතිලාභ ලැබෙන්නේ කා හටද යන්න තීරණය කිරීම

ඔබ තෙස්තමේන්තු රහිතව මියගියහොත්, එනම්, අන්තිම කැමති පත්‍රයක් නොමැතිව මියගියහොත්, ඔබගේ මුදලය තෙස්තමේන්තු රහිත නීතියට අනුව බෙදා හැරේ. මෙය ඔබගේ කැමැත්ත නොවිය හැකිය.

## පොල්මක්කාරයා තෝරා ගැනීම



Ground Floor
221 London Circuit
Canberra City ACT 2601

PO Box 221
Civic Square ACT 2608

Tel (02) 6207 9800
Fax (02) 6207 9811

Email ptg@act.gov.au
Web www.ptg.act.gov.au

ඔබ අන්තිම කැමති පත්‍රයක් සකසන විට, ඔබ විසින් පොල්මක්කරුවෙකු පත්කරයි. පොල්මක්කාරයාගේ රාජකාරිය වන්නේ ඔබගේ අන්තිම කැමති පත්‍රයේ ඇති උපදෙස් අනුව ඔබගේ බුදලය රැකබලා ගෙන වත්කම් බෙදා හැරීමවේ. මහා භාරකරු සහ භාරකරු ඔබගේ පොල්මක්කරුවීමට ඉතා සුදුසුවේ.

## ඔබගේ අන්තිම කැමති පත්‍රය මහා භාරකරු සහ භාරකරු මගින් සකසා ගන්න

මහා භාරකරු සහ භාරකරු අන්තිම කැමති පත්‍ර පිළියෙල කිරීම සම්බන්ධයෙන් විශේෂඥතාවය දරයි. මෙම වැදගත් ලියවිල්ල සම්බන්ධයෙන් උපදෙස් ලබා දීමට අපගේ කාර්ය මණ්ඩලය හට මනා පලපුරුද්දක් ඇත. මහා භාරකරු සහ භාරකරු විසින් ඔබගේ අන්තිම කැමති පත්‍රය පිළියෙල කල හැක්කේ මහා භාරකාරවරයාව පොල්මක්කාරවරයා වශයෙන් නම්කර ඇති අවස්ථාවක පමණි (එනම්, ඔබගේ බුදලය පරිපලානය කරන අය).




Ground Floor
221 London Circuit
Canberra City ACT 2601

PO Box 221
Civic Square ACT 2608

Tel (02) 6207 9800
Fax (02) 6207 9811

Email ptg@act.gov.au
Web www.ptg.act.gov.au